# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2139/11 - 2019 සැප්තැම්බර් මස 02 වැනි සඳුදා - 2019.09.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78(XV)(A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍ය අ. ඉබතුල් රවුෆ් හකීම් වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මෙම නියමය මගින්, (2019 මාර්තු මස 08 වැනි දින අංක 2113/62 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත) එකී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර, එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු වූ, ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින්, 2006 ජුනි මස 09 වැනි දින අංක 1448/27 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන ''වෛද්‍ය පීඨය'' යන අයිතමය සහ ඊට අනුරූප වන්නා වූ එහි II වන තීරයේ දැක්වෙන සටහන් වෙනුවට පහත දැක්වෙන අයිතමය සහ සටහන් ආදේශ කිරීමෙන් එකී නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

| "*I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| වෛද්‍ය පීඨය | 1. කාය ව්‍යවච්ඡේද අධ්‍යයන අංශය |
| | 2. ජීව රසායන සහ අණුක ජීව විද්‍යා අධ්‍යයන අංශය |
| | 3. ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය |
| | 4. අධිකරණ වෛද්‍ය විද්‍යා හා ධූලක අධ්‍යයන අංශය |
| | 5. සායනික වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය |
| | 6. ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යයන අංශය |
| | 7. ප්‍රසව හා නාරිවේද අධ්‍යයන අංශය |
| | 8. ළමා රෝග අධ්‍යයන අංශය |
| | 9. පරපෝෂවේද අධ්‍යයන අංශය |
| | 10. ව්‍යාධිවේද අධ්‍යයන අංශය |
| | 11. භිෂග්වේද අධ්‍යයන අංශය |
| | 12. භෞතවේද අධ්‍යයන අංශය |

1A - PG 4635 — 518 (2019/09)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| "*I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| | 13. මනෝ වෛද්‍ය අධ්‍යයන අංශය |
| | 14. වෛද්‍ය මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය |
| | 15. වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයන අංශය |
| | 16. සම සෞඛ්‍ය විද්‍යා අධ්‍යයන අංශය |
| | 17. පවුල් වෛද්‍ය අධ්‍යයන අංශය |
| | 18. ශල්‍ය වෛද්‍ය අධ්‍යයන අංශය |
| | 19. නිර්වින්දන සහ දැඩි සත්කාර අධ්‍යයන අංශය.". |

අ. ඉබතුල් රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජලසම්පාදන හා
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 අගෝස්තු මස 28 දින,
කොළඹ දී ය.

09 - 521

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.